ත්‍රිවිධ හමුදාවන්ට ලබාදෙන විශේෂඥ පුහුණුව ගැන ඇමරිකා රජයට ස්තුතිවන්ත වෙනවා

- ජනපති මෛත්‍රීපාල සිරිසේන

ලසිත දුමින්ද

අප රටේ ත්‍රිවිධ හමුදාවන්ට ලබාදෙන නව විශේෂඥ පුහුණුවීම් සම්බන්ධයෙන් ඇමරිකානු රජයට ස්තුතිවන්ත වන බව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රකාශ කළේය.

මුල්ලිකුලම්හි පිහිටි ශ්‍රී ලංකා නාවික නෞකා හරණ වයඹ නාවික විධාන මූලස්ථානයේ පැවති ශ්‍රී ලංකා නාවික හමුදාවේ පළමු මැරීන් බලඇණිය විසිර යෑමේ උත්සවයට එක්වෙමින් පෙරේදා (27 වැනිදා) ජනාධිපතිවරයා එසේ පැවසීය.

මෙහිදී නිලධාරීන් හය දෙනෙකු ඇතුළු මැරීන් භටයන් 164 ක් විසිර ගිය අතර, ඔවුන්ට ලාංඡන පැළැඳවීම ද ජනාධිපතිවරයා අතින් සිදුවිය.

අභිමානවත් අයුරින් පැවැති මෙම විසිර යෑමේ උත්සවය අමතා වැඩිදුරටත් අදහස් දැක්වූ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා -

නාවික හමුදාවේ පළමු මැරීන් බලඇණිය විසිරයෑමේ උත්සවය

ශ්‍රී ලංකා නාවික හමුදාව අප රටේ ජාතික ආරක්ෂාව, කලාපීය ආරක්ෂාව සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටුකරන ත්‍රිවිධ හමුදාව තුළ තිබෙන විශිෂ්ටතම හමුදාවක්. නාවික හමුදාවට උගත යුතු පාඩම් සමග අනාගතය සකස් කර ගැනීම ඉතාමත් වැදගත් වෙනවා. අප රටේ පැවති දීර්ඝකාලීන යුද්ධයේදී නාවික හමුදාව ලබාදුන් උතුම් මෙහෙවර මේ රටේ ඉතිහාසයට එක්වී තිබෙනවා. දූපත් රාජ්‍යයක් වශයෙන් වරින් වර විදේශීය ආක්‍රමණවලට ලක්වීමත් ඇතැම් විට රට තුළ අභ්‍යන්තර අරගල ද ඇති වුණා. සටන්කාමීත්වය, රණකාමීත්වය, රණශූරභාවය, දක්ෂතාව සහ ජයග්‍රහණය පිළිබඳව අපේ ආරක්ෂක හමුදාවලට දීර්ඝ කාලීන ඉතිහාසයක් තිබෙනවා.

එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සමග සටන් වැදී ඔවුන් පරාජය කරමින් මාතෘභූමියට සාමය සහ නිදහස ලබා ගැනීම වගේම මේ රටේ භෞමික අඛණ්ඩතාව, ස්වාධීනත්වය ආරක්ෂා කර ගනිමින් ඔබ විසින් කළ මෙහෙවර ඉතා විශිෂ්ටයි. යුද්ධයේදී මියගිය නාවික හමුදා මෙන්ම යුද, ගුවන්, පොලිස්, සිවිල් ආරක්ෂක සියලු ආරක්ෂක අංශවල එම රණවිරුවන් අපි ගෞරවයෙන් සිහිපත් කළ යුතු වෙනවා. ඔවුන්ට ජාතියේ ගෞරවය එදත් අදත් හෙටත් හිමි වෙනවා. යුද්ධය නිසා අතපය අහිමි වූ ආබාධිත වූ සෑම රණවිරුවකු පිළිබඳව ඉමහත් ගෞරවයක් අපේ තිබෙනවා.

මියගිය රණවිරුවන්, ආපදාවලට පත් වූ රණවිරුවන් ඒ සියල්ලන්ගේ පවුල්වල සුබසාධනය සඳහා අප විසින් රජයක් විදිහට ඉටු කළ යුතු වගකීම් සහ යුතුකම් අපි කිසිවිටකත් පැහැර හරින්නේ නැහැ. පසුගිය අවුරුදු දෙකක කාලසීමාව මා මේ රටේ ජනාධිපති ධුරයට පත්වීමෙන් පසුව අපේ ආරක්ෂක හමුදාවල සුබසාධන කටයුතු සඳහා යුද්ධයේදී මියගිය රණවිරුවන්ගේ පවුල් වෙනුවෙන් ආබාධිත රණවිරුවන්ගේ පවුල් වෙනුවෙන් ඔවුන්ගේ සුබසාධනය සඳහා වරප්‍රසාද, දීමනා පහසුකම් වැඩි කිරීම් රාශියක් අපි ඉටුකර තිබෙනවා.



නාවික හමුදාපති වයිස් අද්මිරාල් රවීන්ද්‍ර විජේගුණරත්න මහතා විසින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත සමරු තිළිණයක් ප්‍රදානය කළ අයුරු.

ඡායාරූප - නාවික හමුදා මාධ්‍ය ඒකකයෙනි.

ඒ සියල්ල දුන් පමණින් අප සෑහීමට පත් වෙන්නේ නැහැ. තවදුරටත් ඔවුන් වෙනුවෙන් රජය විදිහට කළ හැකි යුතුකම් අප විසින් සෑම විටම ඉටු කරනවා. ශ්‍රී ලංකා නාවික හමුදාවත් අපේ අනිකුත් හමුදාවන් මෙන් නව තාක්ෂණය හා බද්ධ වී තිබෙනවා. අධිතාක්ෂණික ලෝකයේ නාවික කටයුතු, ජාතික හා කලාපීය ආරක්ෂාව ආදී සියලු කටයුතුවලදී අධිතාක්ෂණික මෙවලම් සමග ඔබේ කය මනස වෙහෙස කරමින් ඔබේ මගේ මාතෘභූමිය වෙනුවෙන් සෑමවිටම කැපවෙනවා.

අප රජය යටතේ විදේශීය රාජ්‍යයන් මිත්‍ර රාජ්‍යයන් එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු සියලු ජාත්‍යන්තර සංවිධානවලින් රටට සහ ආරක්ෂක හමුදාවලට පැසසුම ලබා ගැනීමට ගත හැකි පියවර රැසක් ගනු ලැබුවා. මේ පිළිබඳව විදේශීය ප්‍රධානීන් සමග ද සාකච්ඡා කළා. අපට වඩා සංවර්ධනයෙන්, තාක්ෂණයෙන්, යුද කටයුතුවලින් උසස් තත්ත්වයක සිටින රටවලින් අපේ හමුදාවට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම ප්‍රබල රාජ්‍යයන් විසින් නතර කරලයි තිබුණේ. නමුත් අප රජය බලයට පත්වීමෙන් පසු නව රජයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් ඒ රාජ්‍යයන්ට, ප්‍රධානීන්ට පැහැදිලි කිරීමෙන් පසුව අපේ ආරක්ෂක හමුදාවලට පෙරටත් වඩා අද සහ ඉදිරි කාලයේදී නව තාක්ෂණික යුද උපක්‍රම ක්‍රමවේදවලින් සමන්විත දැනුම ලබාදීමට ඒ රටවල් කටයුතු කර තිබෙනවා.

නාවික හමුදා ක්ෂේත්‍රය පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් ගත් විට ඇමරිකා එක්සත් ජනපදයට තිබෙන්නේ ඉතාම විශිෂ්ට තාක්ෂණික දැනුමක්. එම දැනුම අපේ නාවික හමුදාවට පුහුණුවීම් සඳහා ලබාදීමට ඇමරිකා එක්සත් ජනපදය අප සමග එකඟත්වය පළ කරමින් ඒ සඳහා මේ වන විට කටයුතු කරගෙන යනවා. ඒ නිසා ඇමරිකාව ඇතුළු අපට ප්‍රධාන වශයෙන් පුහුණුවීම් ලබාදෙන ඉන්දියාව, පාකිස්තානය, චීනය, එංගලන්තය, ජපානය ආදී රටවල් සහ සහයෝගය දක්වන සියලුම විදේශීය මිත්‍ර රාජ්‍යයන්ට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඉතාම විශිෂ්ට පුහුණුවකින් පසුව අද විසිර යන ඔබට ජාතික ආරක්ෂාව, රටේ මහජනතාවගේ සුබසාධනය සහ සංවර්ධනය, කලාපීය ආරක්ෂාව සම්බන්ධයෙන් පැවරී ඇති වගකීම් ඉටු කරන්නට ශක්තිය, ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

මෙම අවස්ථාවට ආරක්ෂක රාජ්‍ය ඇමැති රුවන් විජයවර්ධන, ත්‍රිවිධ හමුදාපතිවරු, දෙස් විදෙස් ආරක්ෂක අංශ සාමාජිකයන් ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ.